
# ලෝකාලෝකය

## 2016 ජුනි - අගෝස්තු කලාපය

**කඳු දෙසට මගේ ඇස් ඔසවන්නෙමි.**
**මට උපකාර පැමිණෙන්නේ කොතැනින්ද?**
**මට උපකාර පැමිණෙන්නේ අහස පොළව මැවූ ස්වාමීන්ගෙන්මය.**
**ගීතාවලිය 121 : 01 - 02**



ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.

ළමා පිටුව

# නොදුටු වැස්ස

ආදරණීය දුවේ පුතේ,

වැස්සක් දකිනකොට පුංචි ඔයාලගේ හිතට ලොකුම ලොකු සතුටක් දැනෙනවා නේද? වැස්සට තෙමෙන්න, උඩ පැන පැන වතුරේ නටන්න පුංචි අපි හරිම ආසයි. ඔයාලා දන්නවාද දුවේ පුතේ අවුරුදු ගානකට ඉස්සර මේ පොළොවේ වැස්ස, පින්න දකින්නවත් තිබුණේ නෑ. මේ කථාව තියෙන්නේ බයිබලයේ.

පුංචි ඔයාලා සමහරවිට අහලා ඇති මේ කථාව. මේ මුළු ලෝකයම මවා පාලනය කරන දෙවියන්වහන්සේ සමග නෝවා නම් මනුෂ්‍යයෙකු විශ්වාසවන්ත මිත්‍රයකු ලෙස සිටියා. දෙවියන්වහන්සේ කියන සෑම දෙයක්ම කිරීමට නෝවා ඉතා කැමැත්තෙන් සිටියා.

ඉතිං දුවේ පුතේ ඔයාලා දන්නවාද දෙවියන්වහන්සේ නෝවාට කියපු දේ. හරිම පුදුමයි වැස්සක ලකුණක්වත් නැති වෙලාවක දෙවියන්වහන්සේ නෝවාට කිව්වා විශාල නැවක් හදන්න කියලා. නෝවා මොකද කළේ දන්නවාද? එයා දෙවියන්වහන්සේගෙන් කිසිම ප්‍රශ්ණයක් නොඅසා නැව සාදන්නට පටන් ගත්තා. මේය දැකපු අනිත් මිනිසුන් හැමෝම එකතුවෙලා නෝවාට විහිළු කළා. ඒ හැමෝම නෝවාට පිස්සු හැදීගෙන එනවයි කියලා හිතන්න ඇති.

ඒ වුවත් නෝවා විශ්වාසවන්තව දෙවියන්වහන්සේ කියපු විදියටම නැව හදල ඉවර කළා. ඒ විතරක් නෙවෙයි නෝවා දෙවියන්වහන්සේ කියපු විදියටම ඒ නැවට සතුන් දෙදෙනා බැගින් ඇතුලු කරගෙන තමාගේ පවුලේ සියලු දෙනාත් සමග නැවට ඇතුලු වුනා.

ඉතිං දුවේ පුතේ ඔයාලා දන්නවාද සිදුවුනේ මොකක්ද කියලා? දෙවියන්වහන්සේ නෝවාට පොරොන්දු වුනු විදියටම වැස්ස පටන්ගත්තා. හරිම පුදුමයි දින 40 ක් තිස්සේ රෑ දහවල් දෙකේම වැස්ස පැවතුනා. මහා ජල ගැල්මක් බවට පත් වුනා. පොළොවෙ සිටි මිනිසුන්, සතුන් හා සෑම දෙයක්ම යට කරගෙන ජලය ගලා ගියා. නෝවා සහ පවුලේ සියලු දෙනා නැව තුල ආරක්ෂා සහිතව සිටියා.

දයාබර දුවේ පුතේ අපට මේ කථාවෙන් දෙවියන්වහන්සේ යමක් උගන්වනවා. ඒ තමයි කීකරුකම හා විශ්වාසවන්තභාවය. නෝවා දෙවියන්වහන්සේ කියපු සෑම දෙයකටම කීකරුවෙන්නටත්, විශ්වාසව සිටින්නටත් පුරුදු වී සිටියා. ඒ නිසා නෝවාගේ මුළු පවුලම මහා විනාශයකින් ගැලවුනා.

ඉතිං පුංචි ඔයාලත් මේ කථාව ආදර්ශයකට අරගෙන අපිට ගොඩක් ආදරය කරන දෙවියන්වහන්සේට කීකරුව සිටිය යුතුයි. ඒ වගේම පුංචි ඔයාලගේ දෙමවුපියන්ට, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ටද කීකරු විය යුතුයි. එවිට ස්වර්ගයේ සිටින දෙවියන්වහන්සේ ඔයාල ගැන සතුටු වෙන අතරම ඔයාලට ගොඩක් ආශිර්වාද කරාවි. මේ කතාව බයිබලයේ උත්පත්ති පොතේ 6 වන පරිච්ඡේදයේ සිට 10 වන පරිච්ඡේදය සඳහන් වී තිබෙනවා. ඔයාලත් කියවා බලන්න.

**තබීතා නැන්දා**



# නිදහස්කම

**"පුත්‍රයා (යේසුස් ක්‍රිස්තුස් වහන්සේ) නුඹලාව නිදහස් කරන්නේ නම් සැබවින්ම නුඹලා නිදහස්ය." (යොහාන් 8:36)**

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්-වහන්සේව අදහාගන්නාවූ මනුෂ්‍යයන් ගැන දෙවියන්වහන්සේගේ අදහස ඉහත පදයේ සංක්ෂිප්තව දක්වා තිබේ. පුත්‍රයා-ණන්වහන්සේ අපව නිදහස් කරන බවත් එවිට අප සැබවින්ම නිදහස්වන බවත් එම පදයේ සඳහන් කරයි. උන්වහන්සේ කථාකරන නිදහස ප්‍රධාන කොට "ආත්මික නිදහස" බව අපට පහසුවෙන් තේරුම් ගතහැක. එනම් නිරයේ දඬුවමින් නිදහස් විමයි. ඒ සමඟම පාපයේ බලයෙන් නිදහස, අනේකාකාර ආගමික නීති රීති වලින් නිදහස, මනුෂ්‍යන්ගේ පරම්පරාගත නියෝගවලට වහල්වීමෙන් නිදහස, ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට අත් කර දෙන සේක.

ක්‍රිස්තුස්වහන්සේ අදහාගෙන සිටින තැනැත්තා ඉතා කැපී පෙනෙන ලෙස ඉහත සඳහන් අනේකාකාර නිදහස බුක්ති විඳියි. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ තම කුරුසිය මත මරණය සහ නැවත නැගිටීම කරණකොටගෙන සියළු වහල්කම් වලින් අපව මුදවා තිබේ. "ක්‍රිස්තුස්වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටීමටය" (ගලාති 5:1). එහෙත් කනගාටුදායක ලෙස තමා දෙවියන්වහන්සේගේ දරුවකු බව පවසන වැඩි දෙනෙක්, බොහෝදුරට විවිධ වහල්කම් වලින් බැඳී සිටින බව අපට දැනගත හැක. සමහරෙක් තුළ පාපයේ වහල්කමද, තවත් අය තුළ ආගමික හෝ පරම්පරාගත ගුරුකම්වලට වහල්කමද, තවකෙකු තුළ ලෝකයේ මෝස්තරයට හා පිළිවෙලට වහල් වීමද දැකිය හැක. තවත් ඇතැමෙක් බොරු ඉගැන්වීම් වලට අසුවී මිත්‍යා දෘෂ්ඨිකඅන්තවාදී ඉගැන්වීම්වලට වහල්වෙති. එය ඉතාම කණගාටුදායක තත්වයකි. සමහරු මනුෂයන්ගේ වහල්ලු බවට පත්වේ.

යමෙක් සැබෑලෙස ක්‍රිස්තුස්වහන්සේ අදහාගත්විට ඔහු අළුත් මනුෂ්‍යයකු වී සියලු වහල්කම් වලින් නිදහස ලබයි. (2 කොරෙන්ති 5:17 බලන්න). එහෙත් ඉන්පසු උන්වහන්සේව ලඟින් අනුගමනය නොකිරීම, අනෙක් ඇදහිලිවතුන් සමඟ සහභාගීකම් නොපැවැත්වීම නියම ආත්මික මගපෙන්වීමක් දීමට කිසිවෙකු නොමැතිවීම මගින් ඔවුන් නොදැනුවත්-වම ටිකෙන් ටික පරණ ජීවිතයේ පුරුදු

සහ පාපවලට නැවත වහල් වීමට පටන් ගනී. එය දෙවියන්වහන්සේගේ දරුවෙකුට විය හැකි කණගාටුදායකම තත්වයයි. ඔබද, යේසුස්වහන්සේ, තම ජීවිතයේ සවාමීන් වහන්සේ කරගෙන තිබේ නම්, ඔබගේ මුළු ආත්මික නිදහස ආරක්ෂාකර ගැනීමටත්, උන්වහන්සේ ඔබට දී ඇති ජීවනය භුක්තිවිඳින්නටත් ඔබ කැමති නම් ඔබ විසින් නොවරදවාම අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටියක් තිබේ. එය "ක්‍රියා 2:42" හී ඉතා සංක්ෂිප්තව එහෙත් පැහැදිලි ලෙස දක්වා තිබේ.

"තවද ඔවුහු (යේසුස්වහන්සේ අදහාගත්තවුන්) ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහිද, සහභාගිකමෙහිද, රොටි කැඩීමෙහිද, යාච්ඤා වලද, ස්ථිර ලෙස පැවතුණාහ" ඔවුන් නොකඩවා පැවතුණු කාරණා 4 ක් එහි ඔබට දැකිය හැක.



## ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම

මෙයින් අදහස් කරන්නේ දෙවියන්-වහන්සේගේ වචනයට ඔබගේ ජීවිතයේ ප්‍රධාන තැනදීම ගැනයි. ප්‍රේරිතයන් ඉගැන්වූයේ දේව වචනයයි. ඔබත් ඇදහිලිවන්තයෙක් නම් පළමුකොටම ශු. බයිබලයක් කෙසේ හෝ සපයා ගන්න. එහි "අළුත් ගිවිසුම" යන කොටසෙන් කියවීම ආරම්භකර දිනපතා එය කියවීමට කාලයක් වෙන් කර ගන්න. ඔබ කියවන දේව වචන කොටස් තුලින් ඔබගේ සිතට කථාකරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබගේ ශරීරය ආහාර වලින් පෝෂ්‍ය වෙනවා මෙන්ම, ඔබගේ ආත්මය පෝෂ්‍යවන්නේ දේවවචනය තුලින් පමණි. ඔබගේ නිවසේ හෝ අවට ලගපාත තවත් ඇදහිලිවතුන් සිටිත්නම් ඔවුන් සමග එකතුවී බයිබල් කියවීමේ සහ ඉගෙනගැනීමේ වේලාවක් පවත්වාගැනීම ඉතාම ප්‍රයෝජනවත්ය.

## සහභාගීකම

මෙය ඔබට අවශ්‍යම දෙයකි. අනෙකුත් සැබෑ දේවදරුවන් සමග නිතර ගැවසීම ඔබගේ ආරක්ෂාව සඳහා බොහෝසේ හේතුවේ. ඔබ දැන් දෙවියන්වහන්සේගේ පවුලට අයත් නිසා යක්ෂයා මෙන්ම ලෝකයාද ඔබට නොයෙක් විරුද්ධකම් දක්වනවා ඇත. ඔබගේ පවුලේ අයගෙන්ම සමහරවිට බාධාවන් ඔබ වෙත පැමිණෙනු ඇත. මේ තත්වවලට ශක්තිමත්ව මුහුණ දිමටත්, ඇදහිල්ලෙහි නොසෙල්වී සිටීමටත්, ඔබ අනෙක් ඇදහිලිවතුන් සමග සහභාගිකම් පැවැත්වීම ඉතා වැදගත් වේ. ඔබ කොපමන දුරපලාතක සිටියත් සභා රැස්වීම්වලට හැකි පමණ සහභාගීවන ලෙස ඔබගෙන් ඉල්ලන්නේ ප්‍රධානකොට

මේ හේතුම නිසාය. සහභාගීකමේ රහස මහත්‍ය.

## රොටි කැඩීම

මේ වචනයෙන් අදහස් කරන්නේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සිහිකරමින්, ඇදහිලිවතුන් එක් වී පවත්වන ප්‍රේම මංගල්‍යයකි. රොටි කැඩීමට සහභාගි විය යුත්තේ ඇදහිලි වන්තයින් පමණක් වන අතර 1 කොරෙන්ති 11:23 - 31 යන දේව වචන කොටස මේ ගැන විස්තරයක් ගෙන එයි. මේ රොටි කැඩීමෙහි සහභාගීවීම ඇදහිලි වතුන්ට අත්‍යාවශ්‍යය. එය ඔවුන්ගේ ආත්මික දියුණුවට නිතැතින්ම බලපායි. මේනිසා ඔබ දේව දරුවෙකු නම් පළාත් සභාවක රොටි කැඩීමකට සහභාගීවීමට සෑම උත්සහයක්ම ගන්න. ඔබගේම නිවසෙහි පවා රොටි කැඩීමක් පැවැත්වීමට හැකිබව දේව වචන පෙන්වා දෙයි. ඒ සඳහා තවත් ඇදහිලිවතුන් ඔබ නිවසට රැස්කරගැනීමට පුළුවන් කම තිබිය යුතුයි.

## යාඥා කිරීම

නිතරම දෙවියන්වහන්සේට යාඥා කරන්න. ඔබට සහභාගීකම් පැවැත්වීමට ඇදහිලිවතුන් නැතිව කිතුණු සභාවකින් දුරස්ව ඔබ සිටිනවානම් සහභාගීකම් පැවැත්වීමට මගක් සපයා දෙන මේ යේසුස්වහන්සේට නිතර යාඥා කරන්න. එමෙන්ම ඔබගේ ජීවිතයේ සෑම කුඩා හා මහත් සියලු කාරණා යාඥාවෙන් ස්වාමීන් වහන්සේ වෙත ගෙන යන්න. ඒ සියල්ල උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත හා මගපෙන්වීම ඉල්ලා සිටින්න.

ඉහත ආකාරයට හැසිරීමෙන් ස්වාමීවූ යේසුස්වහන්සේ අපට අත්කරදුන් ඒ මහත් නිදහස්කම භුක්ති විදිමටත්, එය දිගටම පවත්වා ගැනීමටත් හැකිවනු ඇත.

**සංස්කාරක,**
**එස් මෙත්තානන්ද.**
**077 8813197**



# ජීවිතයේ ප්‍රීතිය.

මම ඉතා කුඩා අවදියේ පටන්ම කිතුණු ඇසුරේ වැඩුනු තැනැත්තියක්මි. ළමා පංති වලට සහභාගි වී දේව වචනය ඉගෙන ගත් නමුත් මගේ ජීවිතයේ වෙනසක් සිදු නොවීය.

මනුෂ්‍යයෙකු තුල පවතින බොරුව, ඊර්ෂ්‍යාව, වෛරය, අලසකම වැනි සෑම පාපයක්ම මා තුළද තිබිණි. සභාවේ තිබුණු රැස්වීම් වලට සහභාගි වු නමුත් සෑම විටම මා අසහනයෙන් පෙලුනෙමි.

නොයෙක් වර විවිධ රෝග වලින්ද පෙලුනෙමි. එනමුත් ඒ සෑම විටම දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මහත් ප්‍රේමයෙන් මට ප්‍රේම කරමින් මා සුව කොට මාව ශක්තිමත් කළේය.

මෙසේ පාපයෙන් බරව කාලය ගත කරද්දි ලෝකාලෝක පාඨක සමුළුව පැවැත්වූයෙන් මමද ඊට සහභාගී වුනෙමි. එදින දෙවියන්වහන්සේගේ වචනය මගේ හදවතටම කථා කරන බව මට හැගුනෙමි. එයින් මම බොහෝ සේ කැළඹුනු අතර මා තුල තිබුණු පාපයේ වහල් බැම්ම කැඩී ගොස් මගේ ජීවිතය තුල මහත් සමාදානයක් මට දැනුනි. පුදුම ප්‍රීතියක් මා තුල පැණ නැගිණි.

යේසුස්වහන්සේ ඊයෙත් අදත් එකාකාරමය (හෝබ්‍රෙව් 13:8). මෙම දේව වචනය මට නිතර සිහියට නැගිණි. ඒ මොහොතේ මට සිහිවුනේ යේසුස් වහන්සේ මා වැනි පව්කාරියක් වෙනුවෙන් උන්වහන්සේගේ වටිනා ජීවිතය කුරුසිය මත පුජා කළ ආකාරයයි. ඒ මොහොතේ මා තීරණයක් ගත්තෙමි. ඔව් එදින මගේ තීරණාත්මක දිනය විය. මම සැබෑ ලෙසම උන්වහන්සේ ඉදිරියේ පසුතැවිලි වී මගේ සියලු පාපවලට උන්වහන්සේගෙන් සමාව ගෙන උන්වහන්සේ මාගේ ගැළවුම්කරුවා නන් ලෙස පිළිගතිමි. උන්වහන්සේ මෙදින මට දුන් දිව්‍ය ප්‍රීතිය නිසා මට හමුවුනු සෑම කෙනෙකු සමගම මම ප්‍රීතියෙන් කථා කළෙමි.

මට සදාකාල පීවනය අත්කරදුන් දෙවියන්වහන්සේ එදා පටන් මා අත් නොහරින බව මට විශ්වාස කළ හැකි විය. අධෛර්‍ය වීමට නොයෙක් කරුණු මා ජීවිතය තුළට පැමිණියත් යක්ෂයාගේ කුට උපක්‍රම මා වටා පැමිණියත්, ඒ සෑම මොහොතකම නොවැටී සිටින්නට උන්වහන් සේ මට බලය දුන් නිසා මම උන්වහන්සේට ස්තුති කරන්නෙමි.

ස්වාමීන්වහන්සේ මා සමගය. මම දැන් ප්‍රීතිමත් සිතින් යුතුව උන්වහන්සේට සේවය කරමි. උන්වහන්සේ කැඳවන තුරු උන්වහන්සේ තුළ රැඳී සිටින්නෙමි.

**ඇල්. සී. සීතා ලිඳියා.**

# අඳුරැ අළුයම කාන්තාවෝ සොහොන් බිමක

යේසුස්වහන්සේට බොහෝ සෙයින් ගෞරව කරාවූ ප්‍රේම කළාවූ භක්තිවන්ත කාන්තාවක් පිළිබඳ ඓතිහාසික සිද්දියක් ශුද්ධ බයිබලයේ සටහන් වී තිබේ. එම විස්තරයේ ආරම්භක වාක්‍යය මෙසේය.

**සතියේ පළමුවනදා අළුයම වේලේ අඳුර තිබියදීම, මග්දලායේ මරියා සොහො න් ගේ ලඟට ගොස් ගල අහක්කොට තිබෙන බව දුටුවාය (යොහාන් 20:1).**

අඳුර ගැන පවා නොතකා යේසුස් වහන්සේගේ සොහොන්බිම කරා යන්නට තරම් මේ කාන්තාව උන්වහන්සේට කොපමණ භක්ත්‍යාදරයක් දක්වන්නට ඇතිදැයි අපට සිතාගන්නට පුළුවන. ඇ සමග තවත් කතුන් කිහිප දෙනෙකු වූහ. පිරිමියෙකු ඔවුන් අතර නොවීය. ඇ යන්නේ මරණයට පත්වී සිටින යේසුස්-වහන්සේව දැකීමටයි. දැන් හාස්කම් නැත ලෙඩුන් සුව කිරීම් නැත, අවවාද නැත, කිසිම ආශිර්වාදයක් නැත. ඇයි? යේසුස්-වහන්සේ සොහොන් ගැබේය. ඇ යන්නේ සිරුරට සුවඳ ද්‍රව්‍ය ආලේප කිරීමටයි. සොහොන් ගැබ විවරයට විශාල ගලක් හරස්කර තිබෙන බවත් හේවායෝ මුරකරන බවත් මේ කතුන් නොදන්නවා නොවේ. නමුත් ස්වාමීන්වහන්සේට දැක්වූ අසීමිත භක්ති ප්‍රේමය ඒ බාධාවන් ගැන පැකිලෙන්නට ඉඩ දුන්නේ නැත.

අපගේ ඇදහිලිවන්ත සහෝදරියන්ට මග්දලායේ මරියා හොඳ ආදර්ශයකි. ඇගේ පෙර තත්වය ඔබ දන්නවාද? මාර්ක් 16:9 අනුව ඇය යේසුස්වහන්සේ විසින් යක්ෂයන් හත්දෙනෙකු දුරුකරනු ලැබූ කාන්තාවකි. මරියා මෙන්ම ඔබවද යේසුස් වහන්සේ යක්ෂයාගේ බලයෙන් නිදහස් කර තිබේ. ඔබ වෙනුවෙන් එතුමා ජීවිතය පූජා කර තිබේ. උන්වහන්සේට ඔබ දක්වන ප්‍රේමය කොපමණද?

කෙත්වලින් භෝජන නොලැබුනත් ගාලෙන් එළු බැටළු රැල සිඳදමනු ලැබූවත්, පට්ටිවල ගවයන් නැතුව ගියත් මම වනාහී ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිමත් වන්නෙමි. මාගේ ගැලවීමේ දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රීතිමත් වන්නෙමි (හබකුක් 3:17-18).

මෙන්න සැබෑ ප්‍රේමයේ වචන පරණ ගිවිසුමේ සඳහන් මේ වචන මග්දලයේ මරියා ද දැන සිටින්නට ඇත. සමහරු ස්වාමීන් වහන්සේව සොයන්නේ සිය පුද්ගලික ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙනි. එවන් අයට හබකුක්

අනාගතවාක්තෘවරයාත්, මග්දලායේ මරියාත් අභියෝගයක් වෙනවා ඇත.

ගෝලයෝ තමන්ගේ ගෙවල් වලට වී සිටියහ. යේසුස්වහන්සේව සොයා ගිය මග්දලාගේ මරියා දේව දූතයන්ගෙන් පළමු වරට ශුභාරංචිය ඇසීමේ වාසනාව ලැබුවාය (මතෙව් 28:5). එසේම පළමුවෙන්ම මරණයෙන් නැගිටි යේසුස් වහන්සේ දැකීමේ වාසනාවන්තියද වූවාය (මාර්ක් 16:9). ශුභාරංචිය අන් අය අතරට මුලින්ම ගෙන ගිය අය ලෙසද මේ ස්ත්‍රීහු ඉතිහාසගත වී ඇත (ලූක් 24:8,9).

"ඈ ගොස් උන්වහන්සේ සමග සිටි අය අඬමින් වැලපෙමින් සිටිද්දී ඔවුන්ට දැන්නුවාය (මාර්ක් 10:16). ඒ අය වැලපෙමින් සිටියේ යේසුස්වහන්සේ මැරී සිටි නිසාය. අදත් ලෝකයේ බොහෝ දෙනා පිටතින් කෙසේ වෙතත් ඇතුළතින් අඬමින් වැලපෙමින් සිටිති. බොහෝ වස්තු ඇති අය පවා අභ්‍යන්තරයෙන් මහත් වේදනාවලින් දුක්විඳියි. ක්‍රිස්තියානි නම දරන්නෝද මේ අය අතර සිටිති. තවමත් මරණයෙන් නැගිටුණු ක්‍රිස්තුස්වහන්සේ හඳුනාගෙන නොසිටීමයි ඊට හේතුව. මේ අය අතරට මරියා මෙන් ශුභාරංචිය රැගෙන යෑමට කාන්තා පක්ෂයද ඉදිරිපත් විය යුතුය. මිනිසා පිළිගත්තත් නැතත් ඔබේ කොටස ඉටු කරන්න.

"ගෝලයෝ නැවත තමුන්ගේම ගෙවලට ගියෝය. නමුත් මරියා සොහොන්ගේ ලග පිටත හඬමින් සිටියාය" (යොහාන් 20:10-11). හිස්වූ සොහොන දුටු ගොලයන් ආපසු හැරීයයි. එම සොහොන දුටු මරියා රැඳී සිටියි. ස්වාමීන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තබා සිටියත්, යම් ප්‍රතිඵලයක් නොපෙනෙන කල් හී සමහරු ආපසු ලෝකයට හැරී යති. අත් නොහැර ඇදහිල්ලෙන්, කන්නලවුවෙන් බලා සිටින්නා ස්වාමීන්වහන්සේගේ අනුග්‍රහය දකින්නේය. මරියාගෙන් කදිම ආදර්ශයක් ලොවට ගෙනහැර දැක්වේ. යේසුස්වහන්සේ අනුව ගිය මරියා ඇතුළු අනිත් කාන්තාවන් අතරට එක්වන ලෙස අප ඇදහිලිවන්ත කාන්තාවන්ටද ඇරයුම් කරමු.

**ගුරුහරු**



# උන්වහන්සේ මෙහි නැත



ඉහත සඳහන් පණිවිඩය ලැබුනේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව සොයාගෙන ආ ස්ත්‍රීහු කිහිපදෙනෙකුටයි. හරියටම කියනවා නම් මැරුණාවූ යේසුස් ක්‍රිස්තුස්වහහන්සේගේ ශරීරය බලන්නට සොහොනට පැමිණි ස්ත්‍රීන් හට දේවදූතයකු විසින් දෙනු ලැබූවාවූ පිළිතුර මෙයයි. " උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කී ලෙසම නැගුටුණු සේක. වරෙල්ලා ස්වාමීන් වහන්සේ උන් ස්ථානය බලා ඉක්මනින් ගොස් උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුණු සේක කියා උන්වහන්සේගේ ගොලයන්ට කියාපල්ලා " (මතේව් 28 : 6-7) අදද ඔබ සැම දෙනා වෙතටම අප විසින් දෙන්නට ඇති පණිවිඩයත් මෙයමයි. "උන්වහන්සේ නැගුටුණුසේක" "උන්වහන්සේ ජීවත්ව සිටින සේක". ඔව් අප විසින් ප්‍රකාශ කරන්නේ මැරුණු ගැලවුම්කරුවකු නොවේ. එහෙත් දැන් ජීවමානව වැඩවාසය කරන ගැලවුම් කරුවාණන් වහන්සේයි.

ඉහත සඳහන් අවස්ථාවේ ස්ත්‍රී-වරු පැමිණියේ මැරුණාවූ ශරීරයකට සුවඳ ලාටු ආලේප කරන පිණිසයි. මළාවූ කෙනෙකුට ගෞරව කරන පිණිසයි. අද පවා මනුෂ්‍යයින් කරන්නේ මෙයයි. ඔවුහු මළාවූ නායකයන්ට තවමත් වඳිමින් සිටිති. පුද පූජා පවත්වති. එහෙත් ඔවුනට පිහිට වීමටවත් මග පෙන්වීමටවත් ඒ මලාහු අයට හැකියාවක් නැත. මක්නිසා ද ඔවුහු ජීවතුන් අතර නැත. ඔවුන් විසින් කියාදුන් ඉගැන්වීම් අනුගමනය කරන්නට මනුෂ්‍යයින් හට උදව්වීමටවත් හැකියාවක් ඔවුනට නැත. මක්නිසාද ඔවුහු මැරිලා ගොසින්ය. එහෙත් ජීවමාන දෙවියන්-වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පමණක් මළවුන්ගෙන් නැගිට සිටින සේක.

## යේසුස්වහන්සේගේ ලොව පහලවීම

යේසුස්වහන්සේට පොළවේ පියෙක් සිටියේ නැත. උන්වහන්සේ මරියාගේ කුසේ පිළිසිඳුනේ ශුද්ධාත්මයාණන් කරණ කොටගෙනය (මතෙව් 1:20).


මේ නිසා උන්වහන්සේ තුළට මනුෂ්‍ය සංහතියේ ඇති පාපකාරී ස්වභාවය ඇතුල් වූයේ නැත, උන්වහන්සේ මුළුමනින්ම දෙවියන්වහන්සේ ලෙසත්, මුළුමනින්ම මනුෂ්‍යා ලෙසත්, පාප රහිතව මෙම පොළවේ ජීවත් වූ සේක.

## යේසුස්වහන්සේගේ මරණය

ලෝකයේ සිටියාවූ, ආගමික වේවා, දේශපාලන වේවා, කුමන ආකාරයේ නායකයකුට වුව, ඔවුන් මනුෂ්‍යයන්ව සිටි නිසා තමාගේ ජීවිත ගමන කෙළවර කරන්නට සිදුවිය. ඔවුන්ගේ මරණ මොහොත පැමිණි විට ඉන් එහාට යන්නට හැකියාවක් ඔවුනට තිබුනේ නැත. ඔවුහු මළහ. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මැරුණේ එසේ නොවේ උන්වහන්සේ තම කැමැත්තෙන් සිය ජීවිතය පූජාකල සේක. "මාගේ ප්‍රාණය දෙමි. කිසිවෙක් ඒක මාගෙන් උදුරාගන්නවා නොව. මමම ඒක දෙමි ඒක දෙන්ට මට බලය තිබේ. නැවත ගන්ටද මට බලය තිබේ" (යොහාන් 10 : 15-18). මෙසේ කියන්නට පුළුවන්කම තිබුනේ යේසුස්වහන්සේට පමණි. උන්වහන්සේ ලෝකයට පැමිණියේද මේ එක අරමුණ පිණිසය. එනම් තමාගේ ජීවිතය සියලු මනුෂ්‍යයන් උදෙසා පරිත්‍යාග කරන පිණිසයි. සියලු මනුෂ්‍යයන්ගේ පාපවල දඬුවම උන්වහන්සේ විසින් කුරුසිය මතදී ගෙවා දමන ලදී. "උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලුසේක" කියා 1 පේත්‍රුස් 2 : 24 හි පවසන්නේ මේ ගැනයි.

## යේසුස්වහන්සේගේ නැවත නැගිටීම.

උන්වහන්සේ සිය කැමැත්තෙන් ජීවිතය පූජා කලමුත් තුන්වෙනිදා නැවත නැගුටුනුසේක. මක්නිසාද උන්වහන්සේව රඳවාගෙන සිටීමට මරණයට බලයක් තිබුණේ නැත. උන්වහන්සේ ජීවනයේ අධිපතියායි. උන්වහන්සේ පාප රහිතය. පාප රහිත කෙනෙකු කෙරෙහි මරණයට



කිසි බලයක් නැත. දැන් යේසුස්වහන්සේ ස්වර්ගයේ දෙවි පියාණන්වහන්සේගේ දකුණු පැත්තේ අපගේ ගැලවුම්කරුවාණන් ලෙස වැඩ හිඳින සේක. උන්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම අපට බලපාන ආකාරය පහත පෙනෙන දේව වචන පද 2 න් පැහැදිලි වේ. "උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබූසේක" (රෝම 4 :25). "නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන ගැලවෙන්නාහුය" (1පේත්‍රුස් 3:21).

ඉතින් ප්‍රිය මිතුර, අප විසින් ඔබ වෙත ප්‍රකාශ කරන්නේ මළ නමුත් දැන් ජීවත්වන සියලු බලය ඇත්තාවූ මේ ගැල වුම්කාර තේජවත් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේයි. ඔබට අද පටන් පාපයෙන් ජය සහිත, ප්‍රීතිමත්, අලුත් ජීවිතයක් ලබා දීමට උන්වහන්සේ සූදානම්ව සිටින සේක. මේ වචන ඔබ විසින් කියවීමට ලැබීමද දෙවිය න්වහන්සේගේ සැලැස්මට අනුව සිදුවූවකී. උන්වහන්සේ සියල්ල දන්නා සේක. ඔබගේ මනුෂ්‍යයන් කෙරෙන් සැඟවී තිබෙන යටි සිත පවා උන්වහන්සේ දන්නා සේක. ඔබගේ සිත ලඟ සිට උන්වහන්සේ කථා කරන්නේ ඒ නිසයි. ඔබගේ සිත යේසුස්-වහන්සේට විවෘත කරන්න. ඔබගේ එකම ගැලවුම්කරුවාද, ස්වාමීන්වහන්සේද කොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පිළිගන්න. ඒ ආගමක් නොවේ. සංවිධානයක් හෝ සමිතියක් මොහොතේම උන් වහන්සේ ඔබ සමග සිටින බව ඔබට වැටහී යනවා ඇත. ඔබ මීට පෙර හෝ මේ දැන් යේසුස්-වහන්සේ ඔබගේ පුද්ගලික ගැලවුම් කරුවාද ස්වාමීන්ද ලෙස පිළිගෙන, අදහාගෙන, තිබේ නම් අපවෙත ඒ බව දන්වන්න. ඔබගේ ආත්මික ආරක්ෂාව පිණිසද, අපගේ සේවයත් සභාවත් ස්වාමීන්වහන්සේ තුල ඔබට විවෘතව ඇත.

**මිකායෙල්**



# කුරුසිපත් කිරීම අදත් සිදුවේද?

ඉතිහාසය චක්‍රයක් වගේය. එකල සිදුවූ දෙය නැවත වර්තමාන යුගයන් හී සිදුවීම පුදුමයක් නොවේ. අවුරුදු 2000 පමණ උඩදී සිදුවූ යේසුස්වහන්සේගේ කුරුසියේ මරණය අදත් ලොව සෑම තැන්හී පාහේ සිදු අවේ. මෙය අතිශයෝක්තියක් හෝ අසත්‍යයක් නොවේ. යම් අය මගින් නාට්‍යයක් වශයෙන් කිතු මරණය පිළිඹිඹු කරවන ජවනිකා ගැන නොව, මා අදහස් කරන්නේ. එදා යෙරුසලෙම් සමීපයෙහි යේසුස්වහන්සේ කුරුසිපත් කළේ කවුද? ශුභාරංචි පොත්පත්වල සඳහන් පරිදි නන් වර්ගයේ, නන් වෘත්තීන්හි යෙදී සිටිය අයයි. ඔවුන්ගේ නම්; යුදස් නැමති කිතු ශ්‍රාවකයා, පිලාත් නැමති රෝම ආණ්ඩුකාරයා, යුදෙව් ආගමේ නියමුවන් වූ උත්තම පූජකයන් එදා කුරුසියේ මරණයට හවුල් වූ ජන සමූහයා, බොරු සාක්ෂිකාරයන්, හෙරොද් රජු, වම් පස සොරා, රෝම අධිරාජ්‍යයේ හේවා හටයන් යනාදී කෲර දුෂ්ඨ පුද්ගලයන්ය.

## 1 - යුදාස්

මොහු යේසුස්වහන්සේගේ ශ්‍රාවක යෙකුය. එහෙත් සිත බෙදී තිබුණි. එක් සිතකින් යේසුස්වහන්සේගේ ශ්‍රාවකයෙකු බව ලෝකයාට පෙන්වා, අනිත් සිතින් මුදල් උපයා ගැනීමේ ආශා වෙන් රිදී මිල 30 කට උන්වහන්සේව පාවාදුන්නේය. යේසුස්වහන්සේ ඇසුරු කළමුත්, එතුමාගේ දේශනාවලට සවන්දු න් නමුත්, සිත මාංශික, තෘෂ්ණාධික දේ කෙරෙහි ඇළී ගැලී තිබුණේය. අද කිතුලොවෙහි මෙවැනි අය අල්ප නොවෙත්. නමින් කිතු බැතිමතුන්ය. සිතින් ලෞකිකයෝය. මුදලට, තනතුරට, වාසියකට, වරප්‍රසාද වලට බලයට ක්‍රිස්තුස්වහන්සේ පවාදීමට ඔවුහූ මැළි නොවෙති.

## 2 - පිළාත්

එදා පිළාත් රෝම අධිරාජ්‍යයේ ආණ්ඩුකාරයෙකුය. කායිසර්ගේ සෙනෙවි යෙකුය. පලාන බලයද වගකීමද ඔහු සතුවිය. අදද බලය නිසා හෝ ජන කීර්තියට ලොල් වෙමින් යේසුස්වහන්සේ අතහැර බහුතර ජනයා තෘප්තියට පමුණු වන්නට පෙලඹෙන අය සිටිති. යේසුස් වහන්සේගේ රාජ්‍යය සදා දිව්‍ය රාජ්‍යයකි. මෙලොවෙහි තාවකාලික පිරිහෙන වෙනස්වන රාජ්‍යයක් නොවේ. පිළාත්ගේ සිතේ යේසුස්වහන්සේගේ අවංකභාවය හා තේජාන්විත පුද්ගලික බව හැඟුණු නමුත් සිය නායකයාට භයෙන් පෙළී නිදොස් නිකළැල් යේසුස්වහන්සේව කුරුසියට නියම කළසේක. සදාකාලික විපාකය ප්‍රතික්ෂේපකොට තාවකාලික දිරායන වස්තුවකට ගිජුවිය. මෙවැනි අය

අප හාත්පස ඇත. මිත්‍රය මතක තබා ගන්න. පොළොවේ සියළු රජුන්ද, බලවතුන්ද, යේසුස්වහන්සේගේ සිංහාසනයට අද යටත්වේ. උන්වහන්සෙගේ විනිස දිනයෙහිදි එතුමාගේ සිංහාසනය ඉදිරියේ අප සියලු දෙනාට පෙනී සිටිය යුතුය.

## 3 - තුන් හවුල

යේසුස්වහන්සේව කුරුසිපත් කළ තුන් හවුලක්ද විය. ඔව්හු නම් උත්තම පූජකයන්, ලියන්නන් හා එරිසිවරු වෙති. මොව්හූ කුරුසිපත් කිරිමේ සැලැස්ම රහසිගතව සකස් කළෝය. මන්ද? පරම්පරාගත, අධම, චාරිත්‍රවාරිත්‍ර වඩා සැළකූ නිසාය. බොහෝ දෙනා අතර බාහිර පූජනීය දේ උතුම්ය. විශාල සැරසිලි වලින් සමන්විත පූජාසන යනාදී දෑ අභ්‍යන්තර ජීවිතයේ සිදුවීමට වඩා උතුම් කොට සළකන අය අදත් සිටිති. මේ අයගේ ක්‍රියා යේසුස්වහන්සේව නැවත කුරුසිපත් කරන්නා මෙනි.

## 4 - පිළාත්ගේ බිරිඳ

ඇය මෙසේ තෙපලාය, "ඒ ධර්මිෂ්ඨයාට කිසිවක් නොකරන්න. අද ඔහු නිසා ස්වප්නයකින් බොහෝ දුක් වින්දෙමි", (මතෙව් 27:19). සමහරු යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ පීතෘ, මාතෘ, සහෝදර, අඹුසැමි, ආදරය නිසයි. එවැනි ආදරයක් තිබීම වරදක් නොවෙයි. එහෙත් යේසුස්වහන්සේ අපෙන් ඉල්ලන්නේ ඊට වඩා උතුම් ප්‍රේමයකි. තවද ඉහතකී අවංකාදරය නිසා යේසුස් වහන්සේට ඉහළම ප්‍රේමය පුදන්නේ නැත්නම් අපිත් පිළාත්ගේ බිරිඳ හා සමාන වන්නෙමු.

## 5 - බොරු සාක්ෂිකාරයෝ

ඔව්හු කුලියට අමූලික බොරුකියති, මුදල් ඉපයීමේ ආශාව නිසා තැනක් වෙලාවක් නැත. අයුතු, වැරදි වෘත්තීන්හී යෙදෙන අය බොහෝය. ඒවා බොහෝවිට යේසුස්වහන්සේ සිය ගැළවුම්කරු ලෙස පිළිගැනීමට බාධාවක්ය. ඔවුන්ගේ ජීවිතය පවා බොරුවකි. යේසුස්වහන්සේගේ ඇස් ගිනි දැල්ලක් මෙනි. උන්වහන්සේ සියල්ල දක්නා සේක. විනිශ්චය දිනයේදී සියල්ල එළිදරව්වේ. ද්විත්ව ජීවිතයක් ගතකර සදාකාල නිරාගින්නට යෑම වටිනවාද?

## 6 - හෙරෝද් රජු

අති කෲර දුෂ්ඨ රජෙකි. යේසුස්වහන්සේගේ ළදරු වියේදී ළමා ඝාතනයක් සිදු කලේ උන්වහන්සේව සදහටම නැති කිරීමටය. මේ හෙරෝද් සහ යේසුස්වහන්සේගේ නඩුව ඇසූ හෙරෝද් දෙදෙනෙකි. තවකෙකු තම රාජ්‍යය පැහැර ගනීවි යන බියෙන් එසේ කළේය. මෙවැනි අය අද සෑම තැන්හී සිටිත්. ඔව්හු රජුන් නොවේ. එහෙත් තමා කම හෙවත් මමත්වය නැමති රාජ්‍යය බිඳ දමා නව දිවි සෙත් පිරි දිවියක් ද, රාජ්‍යය ක්ද, ඇති කිරීමට ඔව්හු යේසුස්වහන්සේට ඉඩ නොදෙත්. "මා මාගේ රජුය යනු ඔවුන්ගේ ජීවිත පාඨය වේ. යේසුස් වහන්සේට ඔවුන්ගේ ජීවිතය තුල නියම

නිවහල් බව ඇතිකර ලීමට ඔවුහු ඉඩ නොදෙති. අන්ධකමක මහත.

## 7 - වමේ පැත්තේ සොරා.

යේසුස්වහන්සේ දෙපස සොරුන් දෙදෙනෙකුවද කුරුසිපත් කර තිබුණි. එකෙකු, යේසුස්වහන්සේට ගැරහුම් කළේය. "ඔබ ලොව ගැළවුම්කරු නම් අපත් බේරා, කුරුසියෙන් ඔබත් ගැලවෙන්න." යන වචන වලින් ඔහු අපහාස කළේය. තමාගේ වැරැද්ද ඒත්තු නොගෙන නිරිදෝෂ, කිසිදු පාපතර සිතුවිල්ලක් පවා නොතිබුණු, යේසුස් වහන්සේට චෝදනා කළේය. තමාගේ වැරදි ඒත්තු නොගෙන අන්‍යයනට දොස් තබන අය සෑම තැන්හීම වාගේ සිටිති. "මම වරදක් නොකළෙමි" යන වචනින් අන්‍යයන් මත වැරැද්ද දමා තමාම බේරීමට උත්සාහ කරයි. මෙවැනි අය අදත් යේසුස් වහන්සේව කුරුසිපත් කරයි. මෙය වැඩිදුර විස්තර කිරීම නුවමනාය.

## 8 - රෝම සෙනවියා

අවසානයෙන් කුරුසිය අසල විශේෂ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටිය මිනිසෙක් දෙස බලන්න. ඔහු මවිතයට පත්ව එතැන්හි හිටි හැටියම අඩියක් එහා මෙහා නොවී සිටියි. අහස පැය තුනකට අඳුරෙන් වැටලෙයි. භූමිකම්පාවක් සිදුවේ. පර්වත පැලී යයි. සොහොන්කොත් විවෘතව ධර්මිෂ්ඨ ශුද්ධවරයෝ නික්ම එති. මේවා දෙවියන්වහන්සේගේ උදහස් කෝප යේ සලකුණුද? මුරකරු පපුවට දෝතින් ගසා මෙසේ තෙපළයි. "සැබවින් මුන් වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයායි"

හිතවත මොහු යේසුස් වහන්සේ පිළිගත්තේය. එවැනි තීරණයක් ගැනීමෙන් ඔහුට රෝම අධිරාජ්‍යයේ මරණීය දණ්ඩනයට මුහුණ පාන්නට සිදුවෙයි. එහෙත් ඔහු නිර්භයවම යේසුස්වහන්සේව පිළිගත්තේය. තාවකාලික බලයට වඩා සදා සෙත හා ජීවනය තෝරා ගත්තේය. ඔබේ තීරණය කුමක්ද? යේසුස්වහන්සේ ඔබේ පව් උදෙසා මැරුණුසේක. උන්වහන්සේ මරණය පරාජයකර නැවත නැගිටුණසේක (ක්‍රියා 2 : 23-24). ඔබේ පව් ඒත්තුගෙන, පසුතැවිලිව උන්වහන්සේව ඔබේ ගැළ වුම්කරු ලෙස පිළිගෙන නිරයෙන් මිදී සදා ජීවිතයක් ගත කරන්න සතුටු නම් මෙසේ අවංකව එතුමන්ට පවසන්න. යේසුස්-වහන්ස, මම පව්කාරයෙක්මි. පව්කාර මට කරුණාකළ මැනව. ඔබ වහන්සේ මගේ පව් උදෙසා කුරුසියේ දිවිදුන් බවද, මරණින් නැගිට අදත් ජීවමානව වැඩ සිටින බවත් අදහමි. ඔබ වහන්සේ මගේ එකම ගැළවුම්කාරයාණන් ලෙස පිළිගනිමි. මගේ කිලිටි සිත ඔබතුමන්ගේ අමිල ලෙයින් සෝදා මගේ සිතට වැඩිය මැනව. අද පටන් දේව දරුවෙකු ලෙස ජීවත් වෙන්න මට පිහිටවුමැනව. මාව පිළිගත්තාට ස්තුතියි. ආමෙන්. ඔබ අවන්කවම මේ තිරණය ගත්තා නම් අපටත් දන්වන්න. එය අපට මෙන්ම ස්වර්ගයට ද මහත් ප්‍රීතියක්ය.

**ගුරුහරු**

# මිතුරන් නිසා ජරාවට පත් රජ.



සාලමොන් රජුගේ අභාවයට පසු ඔහුගේ පුත්‍රයෙක් වූ රෙහොබොවම් සිංහාසනාරූඪ කරණ ලදී. ඔහු ෂෙකෙම්හි දි රජකොට ආලේප කරන ලද අතර 1 රාජාවලිය 14 : 21 අනුව රෙහොබොවම් රජ බවට පත් වන විට හතලිස් එක් අවුරුද්දක් වයස්ගතව සිටියේය. ඔහුගේ මෑණියන් වූයේ සලමොන්ගේ භායර්‍යාවන්ගෙන් එක් තැනැත්තියක් වූ අම්මොන්වරුන්ගේ පරපුරෙන් ආ නියමය (2 ලේකම් 12:13)

සාලමොන්ගේ අයහපත් හැසිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ රාජ්‍යය කොටස් දොළසකට කැඩී එයින් එක් රාජ්‍ය කොටසක් පමණක් ඔහුගේ පුත්‍රවූ රෙහොබොවම්ට උරුමවිය. (1 රාජාවලිය 11 : 32) ඉතිරි කොටස් එකොළසින් දහයක්ම යෙරොබොවම් නම් වෙනත් රජෙකුගේ පාලනයට යටත්විය. ඔහු පිළිබඳව අපි පසුව සලකා බලන්නෙමු. සාලමොන් රජු යෙරොබොවම් මරන්ට එය සෙවූ නිසා ඔහු මිසරයට පලාගොස් එහි විසීය. එහෙත් සාලමොන්ගේ මරණයෙන් පසු ඉශ්‍රායෙල් ජනතාව සමග එක්සිත්ව යුක්තිය ඉටුකරවා ගැණීමට යුදාහි රජව සිටි රෙහොබොවම් සොයා ආවේය.

### තරුණ උපදෙස් වරදී

යෙරොබොවම්ගේ පෙරමුණ ඇතිව රජු හමුවූ ඉශ්‍රායෙල් ජනයා බරවැඩ කරවා අධිකව වෙහෙසී මෙන් තමන් අපහසුවට පත් නොකරණ ලෙස ඉල්ලූහ. මෙය එක්තරා සාධාරණ ඉල්ලීමක් වූයේ රජුගේ පියාවූ සාලමොන් විසින් ජනතාවට දැරිය නොහැකි වියගහක් බඳු බර වැඩ සඳහා ඔවුන් යොදවා තිබීම නිසාය. 1 රාජාවලිය 4:7 හා 5:13-15 දක්වා ඔබේ ශුද්ධ බයිබලය පෙරළා කියවන්න. ඔබට වැටහේවි ඔවුන්ගේ අයැදීමේ සාධාරණත්වය කුමක්ද කියා. අපි 1 රාජාවලිය 12:4 කියවමු. "ඔබගේ පියාණෝ අප කෙරෙහි බර වියගහක් තැබුවාහ. එබැවින් ඔබගේ පියාණන්ගේ දුෂ්කර සේවයද ඔහු අප පිට තැබූ බර වියගහද සැහැල්ලුකළ මැනවී. එවිට අපි ඔබට සේවය කරන්නෙමුයි කිවෝය."

රෙහොබොවම් ඔවුන්ට පිළිතුරු දීම දින තුනකින් කල්දැමීය. සෙනග බලා පොරොත්තු සහිතව පිටත්ව ගොස් යලිත් නියමිත දිනයෙහි රජුගෙන් සැනසුම් සහගත පිළිතුරක් පතාගෙන රජ මැදුරට ආවෝය. යෙරොබොවම් ප්‍රධාන නියෝජිතයා විය. රජුගේ පිළිතුර ඉතා වේදනා කාරී ලෙස සිත් පාරවන වචන සමුදායකින් සමන්විතවිය. ඊට හේතුවුයේ රජු විසින් තමාගේ පිය රජුට අනුශාසනය කළ වැඩිමහල්ලන්ගේ උපදෙස් ඉවත දමා කාලීන මිතුරන්ගේ අවවාද - උපදෙස් පිලිපැදීම නිසාය. තමා හමුවට එන ඉශ්‍රායෙල් ජනතාව හා යෙරොබොවම්ට දියයුතු පිළිතුර කුමක්දැයි රජ ඇසූවිට වැඩිමහල්ලා දුන් පිළිතුර දැන් අපි කියවමු. "ඔබ අද මේ සෙනගට සේවකයෙක් වී ඔවුන්ට සේවය කොට ප්‍රිය වචන ඔවුන්ට කතාකර උත්තර දෙන්නෙහි නම් ඔවුන් සෑම කල්හීම ඔබගේ සේවකයන් වෙනවා ඇත." (1 රාජාවලිය 12:7). මෙම වැඩිමහල් උපදෙස කලට සුදුසු එකක්ම වූ නමුදු පාලන තන්ත්‍රයෙහි ආධුනිකකම විසින් ඔහු කාලීන තරුණයන්ගේ උපදෙස වෙතට යොමුකරනු ලැබිණ. එම තරුණ පිරිස ඔහු හා එකට හැදී - වැඩී සිටි අයම මිස ඥනාන්විතව යමක් කිරා-මැන බලා තීරනයක් ගැනීමට තරම් මේරූ අය නොවූහ. ඔවුන්ගේ උපදෙස් ඇතැම්විට තරුණ සිත් උණුසුම් කරන්නට ඉඩතිබේ. එහෙත් එමගින් ඉශ්‍රායෙල් ජනතාවට රජු සමග පැහැදිලි ලෙසම භේදකරවනු ලැබීය. ඔවුන්ගේ උපදෙස් මෙසෙ වියඃ-

## කැරැල්ලක් ඇරඹීම.

"මාගේ පියාණන් නුඹලා පිට වියගහක් තැබුවාහ. මම වනාහී නුඹලාගේ වියගහ තව වඩවඩා බරක රන්නෙමි. "මාගේ පියාණෝ කසලවලින් නුඹලාට දඬුවම් කළහ. මම ගෝනුස් සත්ගෙන් නුඹලාට දඬුවම් කරන් නෙමි....... මාගේ පියාගේ තුනටියට වඩා මාගේ සුලගිල්ල ලොකුය" (1 රාජාවලිය 12:11). (1 රාජාවලිය 12:14). මෙම දැඩි පිළිතුර කිසිසේත් කාලෝචිත නොවීය. පිලොනීය අහියා නම් අනාගතවක්තෘ වරයා ලවා ස්වාමීන්වහන්සේ කියවූ අනාගත වාක්‍යය ඉටුවන පිණිස මෙය සිදුවිය. මන්දයත් සාලමොන්ගේ විශාල රාජධානිය වෙනත් පාලනයකට බෙදීයාමේ පළමු පියවරවූයේ මෙම දැඩි වදන්මාලාව විමය. එහෙත් මුළු රාජධානියේම පාලනය රෙහොබොවම් සතුව පැවතිණ. ඉශ්‍රායෙල්වරු කුපිතව හැරී ගියහ. රාජකාරි මුලාදෑණියාවූ අදෝරාම් නගරයට ගිය අවස්ථාවකදී ඉශ්‍රායෙල්වරු ඔහුට ගල්ගසා මරාදමා රෙහොබොවම් රජුට විරුද්ධව කැරැල්ල ඇරඹූහ. රජුද අශ්ව රථයට නැගී යෙරුසලමට පලාගියේය. ඒ වන විට සිය තරුණ මිතුරන්ගේ මෝඩ උපදේශයේ ආදීනව රජුට තේරුම් යන්නට ඇත. එහෙත් ඔහු පමා වූවා වැඩිය. ඉශ්‍රායෙල්වරු තමන්ගේ නව රජු ලෙස යෙරොබොවම් පත්කර ගත්හ. යලිත් යෙරුසලමට පැමිණ යුද්ධ

කාරයන් එක් ලක්‍ෂ අසූදහසක් රැස් කරගත් රෙහොබොවම් - යෙරොබොවම්ට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළද. ආපසු හැරීයන ලෙස ස්වාමීන්වහන්සේ ෂෙමායා අනාගතවාක්තෘ ලවා ඔවුනට අණකළ සේක. වාසනාවකට මෙන් ඔවුහු දේව නියෝගයට හිස නැමූහ. එසේ නොවන් නට ඉශ්‍රායෙල්වරුන් හා ඔවුන්ගේම ගෝත්‍රයේ යෙරොබොවම්ට පක්‍ෂවූ වැඩි පිරිසක් අතර විශාල අවි ගැටුමක් සිදුවීමට ඉඩ තිබිණ. රාජාවලිය 12:20 අනුව ඔහු (රොහොබොවම්) ගේ රාජ්‍යය යුදාට පමණක් සීමා වූයේය. එහෙත් ඔහු යෙරුසලම වාසස්ථානය කොට ගෙන ආරක්‍ෂක නගර රැසක් පිහිටුවිය (2 ලේකම් 11:5-11).

## රන් වෙනුවට පිත්තල

මෙම රජුගේ පාලන සමයේදී යුදාවරු ජීවමාන දෙවියන්වහන්සේ අතහැරදමා ගස්යට දෙවි දේවතා රූපස්ථම්භ සාදාගෙන ඒවාට නමස්කාර කළෝය. පුරුෂයන් පුරුෂයන් සමගත් ස්ත්‍රීන් ස්ත්‍රීන් සමගත් කැත පාපවලට ඇබ්බැහි වූහ. රෙහොබොවම්ගේ පස්වැනි පාලන වසරේදී මිසරේදී මිසරයේ ෂීෂක් නම් රජු යෙරුසලමට විරුද්ධව සටන් කොට රජමාළිගයේ හා දේවමාළිගයේ තිබූ වස්තු හා සලමොන් විසින් සාදවන ලද රන් පළිස්ද කොල්ලයට ගෙන ගිය බැවින් අසරණවූ රෙහෙබොවම් රජු පිත්තලෙන් අනුකරණ පළිස් සාදාගත්තේය. 1 රාජාවලිය. 14 : 22-28 හා 2 ලේකම් 12 : 1-6 බලන්න. ජනතාවගේ පාපිෂ්ඨත්වය නිසා මිසර රජුගේ වටලෑමට හසුවී තමා සන්තකයේ තිබූ රන් පලිස් අහිමි කරගත් රෙහොබොවම් අපට කියන්නේ කුමක්ද? ධර්මිෂ්ඨ මාර්ගයෙන් ඉවතට හැරී අධර්මිෂ්ඨකමට ප්‍රේම වීමේ ප්‍රතිඵලය "ගැලවීම" නැමති අගනා රන්පළිස් සාතන් විසින් උදුරා ගනු ලැබීය. එසේම අනුකරණ පිත්තල පලිස් සාදා ගැණිමෙන් "විනිශ්චය" පමණක් ඉතිරි වන බව ඔහු අපට අගවාදෙයි. **"පළමුවෙන් ස්වාමීන්වහන්සේ කරණකොට ගෙන කියන ලද්දාවූ ඇසුවන් විසින් අපට ස්ථිර කර දුන්නාවූ මෙපමණ මහත් ගැළවීම අපි නොසළකා සිටියොත් කොහොම ගැලවෙමුද?" (හෙබ්‍රෙව් 2:3).**

**"එබඳු දේ කරන්නන් විනිශ්චය කරමින් - එමදේ කරණ මනුෂ්‍යය, නුඹ දෙවියන්වහන්සේ විනිශ්චයෙන් ගැලවෙන් නෙහියයි සිතින්නෙහිද? නොහොත් නුඹ පසුතැවිල්ලට පමුණුවන පිණිස දෙවියන් වහන්සේගේ යහපත්කම පවතින බව නොදැන උන්වහන්සේගේ යහපත්කමේද ක්‍ෂාන්තියේද ඉවසීමේද බහුලත්වය සුළුකොට සිතා නුඹේ සිතේ මුරන්ඩුකමෙන්ද පසුතැවිලි නොවන සිතින්ද දෙවියන් වහන්සේ ධර්මිෂ්ඨ විනිශ්චය එළිදරව්වන දවසේ උදහසට නුඹ උදහස රැස්කර ගන්නෙහිද? (රෝම 2: 3-6).**

මෙම පද වත්මන් කිතු බැතියන්ගේ පසුබටවීම මුරණ්ඩුකම යටත්කම් හීනවීම් වලදී සිහියට නගා ගත යුතුය. රෙහොබෝවම්ද අපට නිහඬව උගන්වන පාඩම් එයයි. යටත්වන්නා උසස් කෙරේ.

මිසරයේ ෂීෂක්ගේ වටලෑමේදී තමාගේද ජනතාවගේද වරදවල් ගැන පසුතැවිලිව දේව කමාව ඉල්ලාගත් රෙහොබොවම් රජු දේව උදහසින් බේරී ගත්තේය. එහෙත් අප කලින් කියවූ ආකාරයට වටිනා - පෞරාණික වස්තූන් රැසක් ඔහුට අහිමිවිය (2 ලේකම් 12 : 6-9). පුරා දහහත් වසරක් රජකොට යුදා පාලනය කළ ඔහු මියයන විට 58 වසරක් වයස්ගතව සිටියේය. ඔහුගේ පාලන සමයේදි දෙවියන්වහන්සේ මාර්ග අතහැර උන්වහන්සේ සෙවීම එපාකර සිටි බව බයිබලය (2 ලේකම් 2:14) කියයි. වැඩිමහල්ලන් හා පැසුණු හිසකේ ඇත්තවුන්ගේ උපදෙස් පයට පෑගෙන දුවිල්ලකට නොසලකා තමා කිරි කජු මිතුරන්ගේ ආකාලෝචිත උපදෙස් හිස් මුදුණින් පිළිගැනීමේ දුර්විපාකය ඔහු කරා ඉක්මණින්ම ආවේය. 1 පේතෘස් 5:5 අනුව සුදුසු කාලයේ උසස් කරණු පිණිස පලමුවෙන් වැඩිමහල්ලන්ට යටත්වීම වැදගත් වේ. රෙහොබොවම් මෙය කළේ නැත. සිය කාලීන මිතුරන්ගේ උපදෙස් පිලිගන්නා බව හගවමින් ඔහු ඒවා ක්‍රියාවට නැංවීය. එසේ කර රජකම අස්ථිර කරගත්තේය. මෙසේ දාවිත් සාලමොන් බලවත්ව අතෙහි ස්ථිර කරගත් රාජ්‍යය ඔහුගේ අවකල් ක්‍රියාව නිසා බේදී - කඩවී ගිය අන්දම සෝචනීයය. තමා යටත්කර ගන්නා උසස් කරුණු ලැබේ.

රොහොබොවම්ට භාර්යාවන් 18 කුත් උපභාර්යාවන් හැටකුත් පුත්‍රයන් විසි අටක් හා දූවරුන් හැටක් වශයෙන් විශාල පරපුරක් සිටි අයුරු 2 ලේකම් 11:21 කියවා උගත හැක.

**ප්‍රන්සිස් විජයසිංහ**

**දේශනා අසන්න !**

**ගීතිකා අසන්න !**

**පොත් පත් කියවන්න !**

**වෙබ් අඩවියට පිවිසෙන්න**

www.christianfellowshipcenter.com

# උත්තරීතර යේසුස්වහන්සේ

## (2 වන කොටස)

ඉහත මැයෙන් පසුගිය සඟරාවක පල වූ ලිපියේ දිගුවක් ලෙස පහත අදහස් සම්පාදනය කෙරේ.

යේසුස්වහන්සේගේ උත්තරීතර භාවය එලිඑළිදරව් කෙරෙන ප්‍රකාශන 7න් එකක් වන "මළවින්ගෙන් නැවත නැගිටි කුළුදුලා." යන ප්‍රකාශනය දෙස අපගේ අවධානය යොමු කිරීම කාලෝචිත වේ. කිතුණු ඇදහිල්ලේ පුරෝගාමී වූ ප්‍රේරිතය න් පුන පුනා ලෝකයට ප්‍රකාශ කල කරුණු අතරින් යේසුස් ක්‍රිස්තුස්වහන් සේගේ මළවුන්ගෙන් නැවත නැගිටිම ප්‍රධානම තැන ගනී. "ස්වාමිවූ යේසුස් වහන්සේගේ නැවත නැගිටීම ගැන ප්‍රේරිතයෝ මහත් බලයෙන් සාක්ෂි දුන් නේය" (ක්‍රියා 4:33). මෙය ඔවුන්ගේ දේශනාවෙහි මුදුන් මල්කඩ බඳු වූ සත්‍යතාවයයි. අපගේ පව් නිසා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිපත් වු බව ප්‍රකාශ කල සෑමතැනකම අනිවාර්‍යයෙන් උන් වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටිමද සඳහන් කරනු ලැබිය.

"දෙවියන්වහන්සේ උන්වහන්සේව මරණවේදනාවෙන් මුදා නැගිටුණු ලැබූ සේක" (ක්‍රියා 2:24). "නුඹලා ජීවනයේ අධිපතියා මැරවහුය. දෙවියන්වහන්සේ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ සේක" (ක්‍රියා 4:15) "නුඹලා විසින් ගසක එල්ලා මැරූ යේසුස්වහන්සේ ඔබගේ පියවරුන්ගේ දෙවියන්වහන්සේ නැගිටවූ සේක" (ක්‍රියා 5:30). යන ආදී වශයෙන් දිගින් දිගටම යේසුස්වහන්සේගේ නැවත නැගිටිම ගැන ප්‍රේරිතයන් විසින් සාක්ෂි දරණ ලදී. ක්‍රියා 4:10, 10:40. 13:30, 17:31 වැනි කොට ස්වලද සඳහන් වන්නේ මෙම කරුණමය. සැබවින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටුනේ නැති නම් අපගේ ඇදහිල්ල නිෂ්ඵලයි. කිතුණු ඇදහිල්ලේ ඇති සුවිශේෂත්වය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමමය.

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන් සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ ප්‍රතිඵලය පහත සඳහන් සත්වැදෑරුම් කරුණු වලින් උගත හැකිය.

### 1. දේව පුත්‍රයාණන් හැටියට ප්‍රකාශ කරනු ලැබීම.

"ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාර යෙන් දාවිත්ගේ වංශයෙන් ඉපද, ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරණ කොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබූසේක" (රෝම 1:5).

යේසුස්වහන්සේගේ දේවත්වයත්, දේව පුත්‍රකමත් සනාථවන ප්‍රධානතම

සාක්ෂිය නම් මළවුන්ගෙන් නැවත නැගිටීමයි. විවිධ වික්‍රමයන් කල ආගමික හා දේශපාලනික නායකයන් මිනිස් ඉතිහාසය පුරා සිටි නමුත්, ඔවුන් මරණින් කෙළවර විය. එහෙත් යේසුස්වහන්සේ පමණක්ම මළවුන්ගෙන් නැවත නැගිට ජීවමානව නැවත ප්‍රකාශ වූ සේක. උන් වහන්සේගේ දේව පුත්‍රකමේ ඔප්පු සාක්ෂිය එයයි.

## 2. අප ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීමේ රහස.

"උන්වහන්සේ වනාහි අපගේ වරද නිසා පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබූසේක" (රෝම 4:25).

යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට පත්වුයේ අපගේ පාපවල වන්දි මිලය ගෙවීමට බව අපි දනිමු. ඒ හේතුවෙන් අප පව්කමාව ලබමු. එහෙත් දෙවියන් වහන්සේ අපට දෙන්නේ පව්කමාව පමණක්මද? නැත. ඊට වඩා විශාල යමක් උන්වහන්සේ අපට දෙන සේක. එය ශුද්ධ බයිබලයෙහි හඳුන්වන්නේ ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම යනුවෙනි. මෙය අධිකරණයකදී චූදිතයා නිදොස් කොට නිදහස් කිරීමක් වැනිය. පව්කර තිබෙන අප පව් කමාව ලබනවා පමණක් නොව යේසුස් වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන ධර්මිෂ්ඨයන් කොට ගණන් ගනු ලැබේ. එනම් පව් නොකල වුන් ලෙස ගණන් ගනු ලැබේ. මෙය කෙතරම් පුදුම දෙයක්ද? පව්කර ඇති අපි පව් නොකල වුන් සේ ගණන් ගෙන දේව සබඳතාවයට පැමිණ වීම දෙවියන් වහන්සේගේ අරමුණයි. දෙවියන්වහන් සේගේ පරිපූර්ණ දීමනාව එයයි. එය එසේ කල හැකි වුයේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීම නිසාය. යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ ආනිශංසය එයයි.

## 3. යහපත් ජීවිත පරිවර්ථනය

"එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවා සේම, අපිත් ජීවනයේ අලුත්කමින් හැසිරෙන පිණිස, මරණය තුළට බව්තීස්මය කරණකොටගෙන උන් වහන්සේ සමග තැන්පත් කරනු ලැබු වෙමුව. මක්නිසාද උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන් වහන්සේට සම්බන්ධවී සිටිමු නම්, උන් වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධවන්නෙමුව." රෝම 6:4,5.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගැනීමත් සමගම ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අප තුල අපූරු විපර්යාසයක් සිදු කරනු ලැබේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බෞතීස්මයෙහි ගැඹුරු සැබෑ අර්ථයද මෙයයි. එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අපව යේසුස්-වහන්සේගේ මරණය, වළලනු ලැබීම සහ නැවත නැගිටුවනු ලැබීමට සම්බන්ධ කිරීමයි. මෙය අතිශයෙන්ම අභිරහස්මය,

ප්‍රතිහාර්‍යමය, දිව්‍යමය ක්‍රියාවකි. යේසුස්වහන්සේ අදහාගත් පුද්ගලයා එසැනින් පාප පුරුදු අත්හැර අලුත් පුද්ගලයෙකු බවට පත්වන්නේ මේ හේතුව නිසාය. අප අලුත් චරිතයක් ඇති පුද්ගලයන් බවට පත්වන්නේ අපගේ අධිෂ්ඨානය සහ උත්සහාය නිසාම නොවේ, එය දිව්‍ය ක්‍රියාවකි. ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අපව යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීමට සම්බන්ධ කරන සේක, හෙවත් බද්ධ කරන සේක. අලුත් ජීවිත පර්වර්ථනය පැන නගින්නේ මෙම දිව්‍ය ක්‍රියාව කරණකොටගෙනය.

## 4. මාංසික පාපයේ වහල්කමින් මිදීම.

"තවද යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවු තැනන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුල වාසයකරනසේක් නම්, ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේ නුඹලා තුලෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත්කරන සේක" (රෝම 8:11)

ඉහත සඳහන් පදයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේව දෙවරක්ම හඳුන්වා ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැවත නැගිට වූ තැනැන්වහන්සේගේ ආත්මය හැටියටයි. උන්වහන්සේ එම නැවත නැගිටීමේ බලයෙන් අප තුළ සිදු කරන්නේ කුමක්ද? "නුඹලාගේ මරණීය ශරීරය ජීවත් කරන සේක." එහි අරුත නම් පාපයට ලැදී මරණයට නතු අපගේ ශරීරය යලි ප්‍රාණවත් කිරීමකි. ශාරීරික පාප වහල්භාවයෙන් (මාංසික පාපවලින්) අප මුදා නිදහස් කරන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සෙගේ නැවත නැගිටීමේ බලයයි. ස්වාමීවු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම නොවුනානම් මාංසික පාප වහල්කමෙන් නිදහස් වීමට අපට නොහැකි වනු ඇත.

## 5. සේවය සඳහා අවශ්‍ය බලය.

"අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැනගන්න පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය. උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුල ඉස්ටකළාවූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේ මලවුන්ගෙන් නැගුටුවා, සියලු අධිපතිකමටත්, බලයටත්, පරාක්‍රමයටත්, ස්වාමීකමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන්කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා" (එපීස 1:19-21).

ඉහත දේව වචන කොටසේ පාවුල් තුමා ප්‍රාර්ථනා කරන්නේ යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ බලය කිමෙක්ද කියා දැනගැනීමට ඇදහිලිවන්තයන්ගේ ඇස් විවර වන ලෙසටයි. ඇත්තෙන්ම මෙය අප පිළිබඳව යුගයේ අවශ්‍යතාවයයි. ශුද්ධාත්මයාණන්

වහන්සේගේ බලය ගැන බොහෝ කථා කරන අප එම බලය කුමක්දැයි කියාවත් හරි හැටි දන්නේ නැත. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය මළවුන්ගෙන් නැවත නැගිටීමේ බලයයි. සේවය සඳහා අවැසි පන්නරය අපට ලබා දෙන්නේ එම බලයයි. යේසුස්වහන්සේගේ දේවල් රැගෙන අපට ලබා දීම ශුද්ධාත්මයාණන් ගේ සේවයයි (යොහාන් 16:14). යේසුස්-වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ බලය අප තුළ ක්‍රියාත්මක වන විට දෙවියන් වහන්සේට පිළිගත හැකි වූ ආකාරයට සේවය කිරීමට අපට හැකියාව ලැබේ.

## 6. මළවුන්ගෙන් නැවත නැගිටීමේ බලා-පොරොත්තුව.

"නමුත් එක් එක් අය තම තමාගේම ක්‍රමයෙන්. ක්‍රිස්තුස්වහන්සේගේ නැඹුල් ඵලයය, ඉන්පසු ක්‍රිස්තුස්වහන් සේගේ ඊමේදී, උන්වහන්සේ සන්තක වුවෝ (නැගිටින්නෝ) ය. එවිට කෙළවර පැමිණේ" (1 කොරෙන්ති 15:23)

යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ මිලඟ ප්‍රතිඵලය වනුයේ අපටත් නැවත නැගිටීමේ බලාපොරොත්තුව ලැබීමයි. ස්වර්ගයට යෑමට බොහෝ ඇදහිලිවතුන් බලාපොරොත්තුවෙන් සිටින නමුත් තේජවත් සිරුරක් සහිතව මළවුන්ගෙන් නැගිටීමේ බලාපො රොත්තුව බොහෝ ඇදහිලිවන්තයන් තුල නැත. එවැනි අපූරු සිදුවීමක් අපහට සිදුවෙන්ට තිබෙන බවවත් බොහෝ ඇදහිලිවතුන් නොදනිති. එහෙත් ශුද්ධ වන්තයන් ශාරීරික මළවුන්ගෙන් නැවත නැගිටීම ශුද්ධ ලියවිල්ල පුරා උගන්වනු ලබන බරපතල සත්‍යතාවයකි. එවැනි බලාපොරොත්තුවක් අපට ලැබෙනුයේ යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීම නිසාමය.

## 7. යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණී-මේ බලාපොරොත්තුව.

"මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි" යොහාන් 14:3

උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට, ස්වර්ගයට නැගී ගිය නිසාම උන් වහන්සේගේ නැවත පැමිණීමද සහතික බලාපොරොත්තුවක් බවට පත් වේ. යේසුස්වහන්සේ යළි පැමිණෙතැයි අප බලාපොරොත්තුවෙන් සිටින්නේ උන් වහන්සේ නැවත නැගිටි නිසාමය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ සත්ප්‍රකාර ප්‍රතිඵල ගැන සිතා බලන්න. උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි කුළුදුලා වන උත්තරීතර තැනැන්වහන්සේය.

**නෙවිල් ජයසුන්දර**

# සැබෑ කිතුණු සභාවක ගුණාංග

● නොවේ. නිකායක් නොවේ. එකම ශරීරයකි. (1 කොරෙන්ති 12:13)
මෙම ශරීරයේ එකිනෙක අවයවයන් දේවදරුවන් ය.
● සභාව නමැති ශරීරයේ හිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ය. යම්සේ ශරීරය හිස
● යටතේ පාලනය වේද, සභාවේ පාලනය ද එතුමන් අතේය. (එපීස 1:21)
සියලු දෙනාම එක්කෙනෙකු මෙන් ය. (ගලාති 3:28)
● නියම කිතුනු සභාවේ තරාතිරම්, කුලය, ජාතිය,සමාජ තත්වය, ධනවත් දුගී,
● උගත් නූගත්, ආදී කිසි බේදයක් නැත. (ගලාති 3:26-28)
සභාවේ උරුමය සගලොවෙහිය. (1 පේත්‍රුස් 1:4)
● සභාවට ඇතුළත් වන්නේ ආත්මික නව උපතකින් ය. බව්තීස්මයෙන් හෝ නම්
● ලියා ගැනීමෙන් නොවේය. (යොහාන් 3:3)
ඔබට තනිව එම සභාවේ සිටිය නොහැක. එකිනෙකාගේ සහයෝගය හා
● අන්‍යෝන්‍ය උපකාරය අවශ්‍ය වේය. (ක්‍රියා 13:1-3)
නියම කිතු සභාව දෙවියන්වහන්සේගේ වාසස්ථානයයි (1කොරෙන්ති 3:18)
● එය දෙවියන්වහන්සේගේ ගෘහයයි. (එපීස 2:20-22)
● නිරාදෙරටුව ඊට විරුද්ධය ජයගන්නේ නැත. (මතෙව් 16:18)
● දේව දරුවන්ගේ නාම ස්වර්ගයෙහි බැටළු පැටවාණන්ගේ පොතෙහි ලියැවේ.
● භූමික පොතක නොලියවේ. (එළිදරව් 21:27)
යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමේ දී සැබෑ කිතු සභාව ස්වර්ගාරෝහණය
● වේ. (1 තෙසලෝනික 4 : 13-18)
එහි ගිහි පැවිදි බේදයක් නොමැත. (1 පේත්‍රුස් 2 : 5)
● පැවිදි නොවන, නායකයන් හෝ පාලකයන් එහි සිටියි. (එපීස 4:11)
● නියම කිතු සභාව නිකායයන්ගේ එක්සත් කිරීමට ප්‍රයත්න නොදරති. එක
● ශරීරයක් නම් එවැනි එක්සත් කිරීම් නුවමනාය. (1කොරෙන්ති 12:14)
නියම කිතු සභාවේ අවයවයෝ එකිනෙකා විනිශ්චය කර නොගනිති.
● එකිනෙකාව පහත් නොකරයි. (1 කොරෙන්ති 12 : 15-23)
එය දේව වචනයේ ප්‍රතිපත්ති මිස මිනිස් මත පිළිගන්නේ නැත.
● නියම කිතු සභාවේ මිනිස් පාලනයක් නොමැත. (එපීස 1 : 22)
● එය යේසුස්වහන්සේගේ දෙවන ඊම උනන්දුවෙන් බලාසිටිමින් ආත්ම දිනාගැනී-
● මේ සේවයේ වඩ වඩා නිරත වේ.

**ඉහත දැක්වූ කරුණු නියම, සත්‍යවූ ඇදහිලිවන්ත සභාවේ ගුණාංග දක්වයි. මෙහි වගකීම අප එකිනෙකා සතුයි.**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

| | | |
|---|---|---|
| පෙ.ව 8.15 - 9.15 | - | ඉරිදා පාසැල<br>අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා |
| පෙ.ව 9.30 - 12.00 | - | රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම<br>(සිංහල , දෙමළ , ඉංග්‍රීසි) |
| ප.ව 4.00 - 5.00 | - | සුභාරංචි රැස්වීම (සිංහල) |
| ප.ව 6.00 - 7.00 | - | සුභාරංචි රැස්වීම (ඉංග්‍රීසි) |

## අඟහරුවාදා

| | | |
|---|---|---|
| ප.ව 6.30 - 7.30 | - | සුභාරංචි රැස්වීම<br>(දෙමළ) |

## බදාදා

| | | |
|---|---|---|
| ප.ව 6.00 - 7.30 | - | යාච්ඤා රැස්වීම<br>අසනීප සඳහා තෙල් ආලේප කර<br>යාච්ඤා කිරීම |

## සිකුරාදා

| | | |
|---|---|---|
| ප.ව 6.00 - 7.30 | - | බයිබල් අධ්‍යයනය |


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.

Contact No : 011 2581901

E-mail : cfellowship@sltnet.lk

www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/A, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmial.com